# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 සැප්තැම්බර් මස 26 වන දින

## II වන කොටස

## අතිරේකය

(2025.10.01 දින නිකුත් කරන ලදී)

# සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)

**2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00**     **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) Iඅ කොටසේ 24 වන අයිතමයෙහි සඳහන් කරනු ලබන යම් ආයතනයකට අදාළ වන කාලසීමාවක් දක්වමින් එකී අයිතමය යටතේ විධිවිධාන සලසා ඇති නිදහස් කිරීම සීමා කිරීම;

(ආ) Iආ කොටසේ 4 වන අයිතමයේ නිදහස් කරන ලද ද්‍රව්‍යවල තොග සහ සිල්ලර වෙළඳාම ද ඇතුලත් වන පරිදි එකී අයිතමය යටතේ විධිවිධාන සලසා ඇති නිදහස් කිරීම පැහැදිලි කිරීම;

(ඇ) බහාලුම් පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් අන්තර්ජාතික ප්‍රවාහනයට අදාළව සපයනු ලබන සේවාවලට ද නිදහස් කිරීම අදාළ කරමින් II කොටසේ 4 වන අයිතමය යටතේ විධිවිධාන සලසා ඇති නිදහස් කිරීම පුළුල් කිරීම; සහ

(ඈ) II කොටස යටතේ මූල්‍ය සේවා නිදහස් කිරීම,

වේ.

**සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)**

එල්. ඩී.- ඕ 12/2025

## 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය*

**1.** (1) මේ පනත 2025 අංක    දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 2 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) 2 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන පිළිවෙළින් 2025 පෙබරවාරි මස 18 වන දින, 2025 ජූලි මස 1 වන දින සහ 2026 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය.

*2022 අංක 25 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම*

**2.** 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි Iඅ කොටසෙහි 24 වන අයිතමයෙහි "එකී මණ්ඩලය සමඟ විදුලි බලය සැපයීම සඳහා" යන වචන වෙනුවට, "එකී මණ්ඩලය සමඟ විදුලි බලය සැපයීම සඳහා 2025 පෙබරවාරි මස 18 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි Iආ කොටසෙහි 4 වන අයිතමය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

PL 15444 - 465(2025/09)

"4. (අ) 2025 ජූලි මස 1 වන දිනට පෙරාතුව ඉන්ධන පිරවුම්හලක විකුණනු ලැබූ පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්; සහ

(ආ) 2025 ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්;"; සහ

(3) එහි II කොටසෙහි -

(අ) 4 වන අයිතමයෙහි "භාණ්ඩ" යන වචනය වෙනුවට, "බහාලුම් පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් අන්තර්ජාතික ප්‍රවාහනයට අදාළව සපයනු ලබන සේවා ද ඇතුළත්ව භාණ්ඩ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 23 වන අයිතමයෙහි "යම් සේවාවක්; සහ" යන වචන වෙනුවට, "යම් සේවාවක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 24 වන අයිතමයෙහි "සපයනු ලබන සේවා." යන වචන වෙනුවට, "සපයනු ලබන සේවා; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) 24 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"25. 2026 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයක් කරනු ලබන යම් තැනැත්තකුගේ මූල්‍ය සේවා.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.